
## පුස්තකාල උපදේශක කමිටු පිහිටුවීමේ ක්‍රියාවලිය



## 03.1 හැඳින්වීම

පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන පුස්තකාල සේවාව විධිමත් කිරීම, උපදේශකත්වය හා මඟ පෙන්වීම ලබා දීම සඳහා මෙම කමිටුව ස්ථාපිත කරනු ලබයි.

## 03.2 නෛතික අධිකාරිය

ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවේ මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව 2007-05-18 දිනැති අංක 1498 ගැසට් පත්‍රයේ අංක 04.

## 03.3 සුදුසුකම්

- නිලබලයෙන් පත්වන තැනැත්තන්
- අතුරු ව්‍යවස්ථාවේ සුදුසුකම් සපුරා ඇති තැනැත්තන්

**උපදේශක කමිටු සංයුතිය**

- උපදේශක කමිටු සභාපති (පළාත් පාලන ආයතනයේ නිල බලයෙන් සභාපති)
- සභිකයින් (තිදෙනෙක් සභාවේ සභිකයින් අතුරින් සියලු කණ්ඩායම් නියෝජනය වන පරිදි එක් කණ්ඩායමකින් එක් සභිකයෙකු හෝ ඇතුළත් වන පරිදි තුන්දෙනෙකුට නොඅඩු සාමාජික සංඛ්‍යාවක්
- සභා බලප්‍රදේශයේ ජනතාව අදහන ආගම් නියෝජනය වන ආකාරයට එක් එක් ආගම වෙනුවෙන් එක් නියෝජිතයෙක් බැගින්
- ලේකම්
- ප්‍රජා සංවර්ධන නිලධාරී (නිල බලයෙන් කමිටුවේ ලේකම්)
- පුස්තකාලාධිපතිවරුන් හෝ පුස්තකාලය භාරව සිටින්නන්
- බල ප්‍රදේශයේ විදුහලක විදුහල්පතිවරයෙක්
- ප්‍රජා මණ්ඩල නියෝජිතයෙක්

## 03.4 කාර්යය පටිපාටිය

| අනු අංකය | පරිපාටිය | කාල සීමාව | වගකීම |
|---|---|---|---|
| 1 | ඉදිරි වර්ෂය සඳහා උපදේශක කමිටු පත් කිරීමට යෝජනා සම්මතයක් ලබා ගැනීම සඳහා ඉල්ලීම. | පෙර වර්ෂයේ දෙසැම්බර් මාසයට පෙර | ප්‍රජා සංවර්ධන නිලධාරී. |
| 2 | උපදේශක කමිටු සාමාජිකයින් තෝරා ගැනීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම. | පෙර වර්ෂයේ දෙසැම්බර් මස | ලේකම්. |
| 3 | උපදේශක කමිටු රැස්වීම් දින දර්ශනය පිළියෙල කිරීම හා සභා අනුමැතිය ගැනීම. | පෙර වර්ෂයේ දෙසැම්බර් මස | ප්‍රජා සංවර්ධන නිලධාරී. |
| 4 | උපදේශක කමිටු ස්ථාපනය කිරීම | පෙර වර්ෂයේ දෙසැම්බර් මස | සභාපති/ලේකම් |
| 5 | උපදේශක කමිටුව රැස්කිරීම, වාර්තා යාවත්කාලීන කිරීම හා එම වාර්තා සභා ගත කිරීම. | රැස්වීම් දින දර්ශනයට අනුව | ලේකම්/ ප්‍රජා සංවර්ධන නිලධාරී |